# ගැලීලියෝ යුරෝපීයයන් සඳහා පොළොව කරකැවීමට සැරසීම

භාරතීයයනට ජ්‍යොතිෂය ආදී ඇතැම් කටයුතු සඳහා පොළොවට සාපේක්ෂ ව ඉරේ සහ ග්‍රහ වස්තුවල චලිතය ද තවත් ඇතැම් කටයුතු සඳහා ඉරට සාපේක්ෂ ව පොළොවේ සහ ග්‍රහ වස්තුවල චලිතය ද සලකා බැලීමේ ප්‍රශ්නයක් නොවී ය. ඒ චලිත දෙක ම සාපේක්ෂ චලිත ලෙස සැලකීමට ඔවුහු පුරුදුව සිටියහ. ඔවුන් ඇතැම් විට ඒ චලිත ශිව නර්තනයෙහි විවිධ අවස්ථා ලෙස සැලකුවා විය හැකි ය. බ්‍රහ්මන් පරම සත්‍යය වුව ද බ්‍රහ්මන්ගේ ම වෙනත් ස්වරූපයක් ලෙස ඔවුන් ශිව දෙවියන් සැලකූ හෙයින් හා ඔවුන් ශිව නර්තනයෙන් ලෝකය විවිධ ආකාරයෙන් විද්‍යමාන වන බව  විශ්වාස කළ බැවින් එකම දෙය විවිධ ආකාරයෙන් දැකීමට ඔවුහු පුරුදුව සිටියහ. යථාර්ථය එකක් වුව ද එය ඒ ඒ අයට ඒ ඒ අවස්ථාව අනුව ඒ ඒ ආකාරයෙන් ගෝචරවන බව විශ්වාස කිරීමට ඔවුන්ට බාධාවක්  නොවී ය. මේ සාපේක්ෂතාවාදය නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය යනුවෙන් අප විසින් මගේ ලෝකය කෘතියෙහි හා වෙනත් තැන්වල හඳුන්වා දෙනු ලැබ ඇති සාපේක්ෂතාවාදයෙන් වෙනස් බව මෙහි දී අවධාරණය කළ යුතු ය. මෙහි දී යථාර්ථයක් ඇති බව පිළිගැනෙන අතර ඒ යථාර්ථය එකිනෙකාට එක් එක් අයුරින් දෘෂ්‍යමාන විය හැකි යැයි පිළිගැනෙයි. එය ප්‍රතිමාවක් එක් එක් පැතිවලින් නරඹන්නාක් මෙනි. ප්‍රතිමාව යනුවෙන් යමක් පැවතුන ද, විවිධ පැතිවලින් හා විවිධ දුරෙන් සිට බැලීමේ දී ප්‍රතිමාව විවිධ ආකාරයෙන් පෙනෙයි. අවශ්‍ය නම් ප්‍රතිමාව එසේ විවිධාකාරයෙන් නරඹන අයට පසුව එකතු වී සාකච්ඡා කර ප්‍රතිමාව ප්‍රති නිර්මාණය කිරීමේ හැකියාවක් ද වෙයි. එහෙත් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙහි දී එවැන්නක් සිදු නොවේ. එහි දී යථාර්ථයක් ඇති බවක් නොපිළිගැනෙයි. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයට අනුව අනිත්‍ය දුක්ඛ අනාත්ම අනාවබෝධය නිසා එනම් අවිද්‍යාව නිසා මිනිසා ද ඇතුළු සත්වයෝ නොයෙකුත් දෑ සංස්කරණය කරති. මා දකින ප්‍රතිමාව තවත් අයකු දකින ප්‍රතිමාව නොවේ. මා දකින්නේ මගේ නිර්මාණයකි. එය අනෙකකුගේ ප්‍රතිමාවෙන් වෙනස් වෙයි. මගේ නිර්මාණය මගේ මනසට මගේ සංස්කෘතියට හා මගේ ඉන්ද්‍රිය පද්ධතියට සාපේක්ෂ වෙයි. ඒ පවත්නා යමක් මට පෙනෙන ආකාරය නොව මා අවිද්‍යාව නිසා සංස්කරණය කර ගත් දෙයකි.

එහෙත් කතෝලික චින්තනයෙහි නිර්මාණාත්මක සාපේක්ෂතාවකට නොව කිසිම සාපේක්ෂතාවකට ඉඩක් නොමැති විය. පරම සත්‍යයක් ඇති බවත් ඒ පරම සත්‍යය සියළු දෙනාට එකම ආකාරයෙන් ගෝචර විය යුතු බවත් බටහිර යුරෝපීයයෝ ඇදහූහ. සාපේක්ෂ චලිතය පිළිබඳ අදහස භාරතයෙන් හා සමහර විට වෙනත් ප්‍රදේශවලින් ද බටහිර යුරෝපයට ඇතුල් වූ විට මුල දී ඒ පිළිගැනීමට බොහෝ බටහිර යුරෝපීයයනට නොහැකි විය. කතෝලික චින්තනයට අනුව පරම සත්‍යය එකම ආකාරයකින් සියළු දෙනාට ම ගෝචර විය යුතු බැවින් හා අහස දෙස බැලූ කල පෙනෙන්නේ පොළොව වටා ඉර ගමන් කිරීම බැවින්, එය එනම් පොළොව වටා ඉර ගමන් කිරීම එකම හා පරම සත්‍යය විය. එබැවින් වෙනත් චලිත තිබිය නොහැකි බව කතෝලික චින්තනය මගින් ලබා ගත හැකි නිගමනය විය. කලින් සඳහන් කළ කරුණු ද සැලකිල්ලට ගත් විට කතෝලික පල්ලියට කළ හැකි වූයේ පොළොව ඉර වටා යන්නේ යැයි කී අය දේව ද්‍රෝහීන් ලෙස හංවඩු ගසා මරණයට නියම කිරීම ය.

ගැලීලියෝ විද්වතා පොළොව ඉර වටා යන්නේ යැයි කී විට එකල විසූ බොහෝ දෙනකුට එය විශාල ප්‍රශ්නයක් විය. පොළොව ඉර වටා යන්නේ නම් දවාල හා රැය ඇති වන්නේ කෙසේ ද? ඉර පොළොව වටා යන විට දවාල හා රැය ඇති වීම පහසුවෙන් ම තේරුම් ගත හැකි ය. ඉර පොළොවේ අප සිටින පැත්තට එල්ල වී ඇති විට දවාල ද අනෙක් පසට එල්ල වී ඇති විට රාත්‍රිය ද ඇති වෙයි. එහෙත් පොළොව ඉර වටා යන්නේ නම් අවුරුද්දකට එක් වතාවක් නොව තුන්සිය හැට පස් වතාවක් පමණ දිවා රෑ මාරු වීමට නම් පොළොව ඉර වටා යෑමට අමතර ව තමා වටා ද කරකැවිය යුතු වෙයි. මෙය සංකීර්ණ චලිතයකි. දැන් ප්‍රශ්නයක් වෙයි. මෙවැනි චලිතයක් පොළොවට ඇත්නම් අප එය දැන ගන්නේ කෙසේ ද?

මෙහි දී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වෙයි. පොළොවට ඇතැයි කියන මේ චලිතය කුමකට සාපේක්ෂව දැයි අප තවමත් කියා නැත. එයට හේතුව ගැලීලියෝ පඬිවරයාට පෙර චලිතයෙහි සාපේක්ෂ බව බටහිර යුරෝපයට ප්‍රශ්නයක් නොවීම ය. චලිතයක් ඇත්නම් එය සියළු දෙනාට දැන ගත හැකිය හා එය නිරපේක්ෂ වේය වැනි පදනමක පිහිටා ඔවුන් කටයුතු කර ඇති බව පෙනෙයි. කෙසේ හෝ පොළොවට ඇතැයි කී චලිතයත් සමග සාපේක්ෂ චලිතය පිළිබඳ

© Prof. Nalin De Silva

අදහස ක්‍රමයෙන් බටහිර යුරෝපයට ඇතුල් විය. පොළොවට චලිතයක් නැතැයි නිගමය කිරීම සඳහා බටහිර පැරැන්නන් යොදා ගත් තර්කයක් විය. මේ කරුණු මා උපුටා ගන්නේ පෝල් ෆෙයරාබන්ඩ් මහතාගේ අගේන්ස්ට් මෙතඩ් නම් කෘතියෙනි. එහි සඳහන් තොරතුරු අනුව අදාළ තර්කය මෙසේ ය. උස ගසකින් වැටෙන පොල් ගෙඩියක් සලකන්න. පොල් ගෙඩිය නටුවෙන් ගිළිහුණු අවස්ථාවේ සිට එය පොළොවට වැටීම දක්වා යම් කාලයක් ගතවෙයි. පොළොවට චලිතයක් ඇත්නම් මේ කාලය තුළ පොළොව යම් දුරක් ගෙවා යා යුතු ය. එසේ නම් පොල් ගෙඩිය බිමට පතිත වන විට පොළොවෙහි ඇති පොල් ගසේ මුල (කඳ ද සමගින්) පොළොවත් සමග ඒ දුර ගෙවා ගොස් ඇති බැවින් පොල් ගෙඩිය පතිත විය යුත්තේ පොල් ගසේ මුලෙන් තරමක් ඈත ය. එනම් පොල් ගසේ මුල ද රැගත් පොළොව ඒ කාලය තුළ ගෙවා ගොස් ඇති දුරට සමාන දුරකට ඈතින් පොල් ගෙඩිය බිම පතිත විය යුතු ය. එහෙත් අප දන්නා පරිදි පොල් ගෙඩිය පතිත වන්නේ පොල් ගසේ මුල ම ය. එසේ නම් ඉන් කියැවෙන්නේ පොල් ගෙඩිය වැටීමට ගතවන කාලය තුළ පොල් ගසේ මුල හා පොළොව කිසිම දුරක් ගෙවා ගොස් නැති බව ය. වෙනත් වචනවලින් කිවහොත් එකල උගතුන් මෙයින් ලබාගත් නිගමනය වූයේ අදාළ කාලය තුළ පොළොව චලනය නොවන බව ය. පොල් ගෙඩි ඕනෑම කාල පරාසයක් තුළ වැටිය හැකි බැවින් මෙයින් නිගමනය වන්නේ පොළොවට කිසිම කාලයක් තුළ චලිතයක් නොමැති බව ය. මේ තර්කයෙහි ඇති වැරැද්ද කුමක් ද? තර්කවල වැරදි කිහිප ආකාරයකට සිදු විය හැකි ය. තර්ක කරන්නේ යම් කිසි පදනමක, පසු බිමක පිහිටමින් ය. මේ පදනමෙහි උපකල්පන වෙයි. හුදු තර්කයෙහි වැරැද්දක් නැති වුවත් උපකල්පනවල වැරදි තිබිය හැකි ය. පොලොව චලනය නොවන බව නිගමනය කෙළේ වැරදි උපකල්පන මත පදනම් වෙමිනි.

අපට බොහෝ විට තර්කයක් පිටුපස ඇති උපකල්පන අමතක වෙයි. අපි වර්තමානයෙන් සරල උදාහරණ දෙකක් ගනිමු. මේ දිනවල පාසල් සිසුන් අතර මෙන් ම විශ්ව විද්‍යාල සිසුන් අතර ද ගැටුම් සිදු වෙයි. මේ ගැටුම්වලින් ඇතැම් විට සිසුහු මිය යති. මෙය කිසිසේත් ම යහපත් දෙයක් නොවෙයි. එය වහාම නතර කළ යුතු ය. එහෙත් ඒ නතර කළ හැක්කේ කෙසේ ද? ඒ සඳහා ගැටුම්වලට හේතුව සොයා ගත යුතු ය. දැන් මෙරට මහදැනමුත්තන් ඒ පිළිබඳ ඉදිරිපත් කරන මතයක් වෙයි. ඒ මතයට අනුව ගැටුම්වලට හේතුව අසූවේ දශකයෙන් පසුව ඇතැයි කියන යුද්ධයයි. වත්මන් තරුණ පරපුර හැදී වැඩී ඇත්තේ ඊනියා යුද්ධය හා ප්‍රචණ්ඩත්වය තුළ බැවින් ඔවුන් එකිනෙකා ඇණ කොටා මරා ගන්නා බව කියැවෙයි. එබැවින් මේ මහදැනමුත්තන්ට අනුව ශිෂ්‍ය ප්‍රචණ්ඩත්වය ද නැති කළ හැක්කේ ඊනියා යුද්ධය නැවැත්වීමෙනි. එනම් දෙමළ ජාතිවාදීන්ට උතුරු හා නැගෙනහිර පළාත් දන් දීමෙනි. තවත් පිරිසකට අනුව ශිෂ්‍ය ප්‍රචණ්ඩත්වයට හේතුව 1977 දී බිහි කළ විවෘත ආර්ථිකය වෙයි. එහෙත් මේ නිගමන, එනම් තමන්ට අවශ්‍ය වූ නිගමන, පිටුපස ඇත්තේ ශිෂ්‍ය ප්‍රචණ්ඩත්වය 1977 න් හෝ 1980 න් හෝ පසුව ඇති වූවක් ය යන්න ය. මේ බොහෝ දෙනා අමතක කරන කරුණක් නම් හැටේ දශකයේ දී ද ඒ ඒ දේශපාලන පක්ෂවලට හිතවත් සරසවි සිසුන් අවි ආයුධ ගෙන විරුද්ධ පක්ෂවල හිතවතුන් සමග සටන් කළ බව ය. අද පාර්ලිමේන්තුවේ හා පළාත් සභාවල සිටින ඇතැම් මන්ත්‍රීවරු හා ඇමතිවරු හැත්තෑවේ දශකයේ දී සරසවි සිසුන් ලෙස කඩු පිහි බෝතල් කටු ආදිය ගෙන තම විරුද්ධවාදීන් සමග සටන් කළ බව අමතක කර අපේ කාලෙ නම් ඔහොම දේවල් සිද්ධ වුණේ නැතැයි කියති. අවුරුදු හතළිහකට පෙර ද සරසවියේ අමානුෂික නවක වද තිබූ බව මා අත් දැකීමෙන් ම දන්නා කරුණකි. එහෙත් හැටේ දශකයේ නොව අසූවේ දශකයේ සරසවි සිසුන් වූ අය ද පවසන්නේ තමන්ගේ කාලයේ තිබුණේ සින්දුවක් කීම වැනි සරල නවක වද බව ය. මෙවැනි බොරුවලින් ප්‍රශ්නය විසඳා ගත නොහැකි ය. මේ බොරු කියන්නේ නවක වදය හා ශිෂ්‍ය ප්‍රචණ්ඩත්වය 1977 න් පසුව ඇති වීය යන පදනමෙන් ය. පදනම වැරදි වූ විට ඉන් පසු නිවැරදිව තර්ක කළ පමණින් ප්‍රශ්නය විසඳීමට නොහැකි ය.

මා දක්වන අනෙක් උදාහරණය ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය පිළිබඳ ව ය. ප්‍රශ්නයට මුල එක්කෝ 1956 දී, නැත්නම් 1983 දී හෝ වෙනත් වර්ෂයක දී දෙමළ ජනයාට වූ ඊනියා අසාධාරණයක් ලෙස පෙන්වීමට මහන්සි ගන්නෝ ඊනියා උගතුන් අතර වෙති. ඒ පදනමේ සිට කිසි ම දිනෙක ප්‍රශ්නය විසඳිය හැකි නොවේ. එයට හේතුව විසඳීමට යන්නේ බොරු ප්‍රශ්නයක් වීම ය. බොරු පදනමක සිට ප්‍රශ්න විසඳීමට තැත් කිරීමෙන්, තර්ක කිරීමෙන් සිදු වන්නේ ප්‍රශ්නය තව තවත් අවුල් වීම පමණකි. ප්‍රශ්නයේ මුල දිගින් දිගට ම ඇත්තේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය බවත් 1956 සිට 1962 දක්වා වූ ඉතා කෙටි කාලයක් තුළ හැරෙන්නට වර්තමානයත් ඇතුළුව 1505 සිට අද වන තුරු අවුරුදු පන්සියයක් පමණ කාලයක් තුළ සිදු වී ඇත්තේ හා සිදු වෙමින් පවතින්නේ සිංහල බෞද්ධයන්ට මෙරට හිමි තැන අහිමි වීම බවත් 1956 සිට 1962 දක්වා ඒ අහිමි වූ දැයින් සිංහල බෞද්ධයනට ලැබුණු සොච්චමක දෙය දෙමළ

© Prof. Nalin De Silva

ජනයා ඇතුළු අසිංහල අබෞද්ධයන්ට සිදු වූ අසාධාරණයක් ලෙස බටහිරයන්ගේ හා ඔවුන්ගේ බුද්ධිමතුන්ගේ හා ඔවුන් අනුකරණය කරන්නන්ගේ අනුග්‍රහයෙන් දෙමළ ජාතිවාදීන් ලොව පුරා පතුරවා ඇති බවත් අමතක කර ප්‍රශ්නය විසඳිය හැකි නොවේ. ප්‍රශ්නයේ මුල තරමක් හෝ දැන ගැනීමට කැමැත්තෝ ප්‍රභාකරන් ඔහුගේ සීයලා බාප්පලා හා මස්සිනාලා යන කෘතිය කියවත්වා!

ගැලීලියෝ විද්වතාණන්ගේ කාලයේ දී වැරදි පදනමක සිට වැරදි උපකල්පන සහිත ව තර්ක කිරීමෙන් පොළොවෙහි චලිතයක් නැති බවත් පොළොව ස්ථිතික ව පවතින බවත් පෙන්වීමට එකල සිටි උගතුන්ට හැකි විය. මේ පදනම හා උපකල්පන වැරදි බව පෙන්වන්නේ කෙසේ ද? ගැලීලියෝ විද්වතා එදා මුහුණ දුන් ප්‍රශ්නය වූයේ එයයි. තර්කයක ඇති වරදක් පෙන්වීමට වඩා තර්කයෙහි පදනමෙහි හෝ උපකල්පනවල ඇති වරද තේරුම් කර දීම අපහසු ය. එයට එක් හේතුවක් වන්නේ තර්ක කිරීමෙන් පමණක් ඒ වැරදි පෙන්වා දීමට ඇති අපහසුව ය. බොහෝ දෙනා එසේ නොසිතුව ද එයට සමාජයීය හේතු ද වෙයි. සමාජය පදනම වෙනස් කිරීමට සූදානම් නැත්නම් ඒ තේරුම් කර දීම සමාජයට පිලිගැන්වීම අපහසු ය. මෙහි දී බලය පිළිබඳ ප්‍රශ්නය ද මතුවෙයි. කතෝලික පල්ලිය ඉතා බලවත් ව තිබූ අවධියක ගැලීලියෝ විද්වතාණන්ට නොව ශක්‍රයාට වුව ද පොල් ගෙඩිය වැටීමේ තර්කයට පදනම් වූ දෑ වෙනස් කිරීම පහසු නොවේ. එහෙත් ගැලීලියෝ විද්වතා ඉපදුණේ කතෝලික පල්ලියේ බලය බටහිර යුරෝපයේ බිඳී යෑම ආරම්භ වීමට තිබූ අවධියෙහි ය. කතෝලික චින්තන ආධිපත්‍යයේ මුල් දෙදරීම මේ වන විට ඇරඹී තිබුණි. ඒ බටහිර යුරෝපය වෙනත් චින්තනයක් ඉල්ලා සිටි අවධිය විය. ගැලීලියෝ විද්වතාණන්ට සවන් දීමට සූදානම් වූ පිරිසක් මේ වන විට ඉතාලියේ ද බටහිර යුරෝපයේ ද සිටියහ. මෙයට හේතුව ධනපති පංතිය ඇති වීම වැනි මුග්ධ කතා වඳ පීදූ මාක්ස්වාදීන් ඉදිරිපත් කිරීමට ඉඩ ඇත. ඔවුන්ට කිව යුත්තේ ධනපති ක්‍රමයක් හෝ ඊනියා ධනපති පංතියක් හෝ ඒ වන විට බටහිර යුරෝපයේ ඇති වී නොතිබූ බවත් පසු කාලයක ධනපති ක්‍රමය පවා බිහි වූයේ නව චින්තනය ක්‍රමයෙන් බටහිර යුරෝපයේ අධිපතිවාදී චින්තනය බවට පත්වීම හේතුකොටගෙන බවත් ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva